31/05/2011 - ලංකාදීප

**වර්තමාන ප්‍රශ්න දෙස අලුත් ආකල්පයකින් බලමු - මිලින්ද මොරගොඩ**

පොසොන් මාසය බෞද්ධ ජනතාවට වැදගත්ය. ලංකාවට අලුත් දර්ශනයක්, නව සංස්කෘතියක් ඇතුළු වන්නේ පොසොන් මාසයේ සිදුවූ මිහිඳු මහ රහතන් වහන්සේ මෙරටට වැඩමවීම සමගය. වසර දෙදහස් පන්සිය පණහකට වැඩි නව යුගයක් පොසොන් මාසයේ මෙම සිදුවීම සමග ඇරඹෙයි. එය අලුත් දර්ශනයක උදාවකි. බුද්ධ ධර්මය පදනම් කරගත් නව පාලන ක්‍රමයක එළැඹුමකි.

අශෝක අධිරාජ්‍යයා ඉන්දියාවේ විසූ ශ්‍රේෂ්ඨ බෞද්ධ පාලකයෙකි. සටන්කාමියෙකු වූ හෙතෙම අධිරාජ්‍යයක් ගොඩනැගීය. ඉන්දියාවෙන් ආරම්භකර ඇෆ්ගනිස්ථානය දක්වා රටවල් යටත්කරගත් අශෝක අධිරාජ්‍යයා තමන් ගේ ජයග්‍රහණ සිත නිවන දිණුමක් නොවන බව පසක්කර ගත්තේය. බුද්ධ දේශනාව කෙරෙහි පැහැදී බුදු දහම වැළඳගත් හෙතෙම ධාර්මිකව රට පාලනය කරමින් බුදු දහම ලොව පුරා පතුරවන්නට ක්‍රියා කළේය. මහජන සුබසිද්ධිය තකා විශේෂ ආඥා පැනවීය. තම ආගම ඇදහිය යුතු අසල්වැසියාගේ ආගම් ඇදහිල්ලට දොස්පවරමින් නොවන බව ඔහුගේ ආඥාවකි. අන්‍ය ආගමකට ගරු කිරීමෙන් තමන් අදහන ආගමට ඇති භක්තිය වැඩිවන බව අශෝක අධිරාජ්‍යයා පෙන්වා දුන්නේය. පරිසරය, ගහ කොළ, වන සතුන් සමග බැඳුණ ජන ජීවිතය අගය කළේය.

පොසොන් මාසයේ දී සිරි ලකට බුදු දහමේ පණිවුඩය ලැබෙන්නේ මෙම අශෝක අධිරාජ්‍යයාගේ අනුදැනුම ඇතිවය. එතුමා සිය පුතු පසුව බුද්ධ ශාසනයට ඇතුලු වූ මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කරවීය. එවකට මෙරට රාජ්‍ය පාලනය කළ දේවානම් පියතිස්ස රජතුමා ධර්මාවබෝධයට තරම් සුදුසු දැයි මිහිඳු මහ රහතන් වහන්සේ විමසූ අන්දම ප්‍රකටය. රජතුමා බුදු දහම වැළඳ ගත්තේය. අශෝක රජු ගේ දියණිය සංඝමිත්තා නමින් පැවිදි වූ අතර ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් රැගෙන මෙරටට වැඩම කළාය. ඉන්දියාවෙන් බුදු දහම සමග අටලොස් කුළයක කළා ශිල්පීන් පැමිණ නව ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයක් අරඹන ලද බව ඉතිහාසයෙහි සඳහන්ය. අද ශ්‍රී ලාංකික සමාජය දියුණුය. නමුත් වර්තමාන සමාජය තුළ බෞද්ධ දර්ශනය අනුකූලව ජීවත්වන බව නොපෙනේ. බෞද්ධකම නමට පැළඳ සිටින පදක්කමක් පමණකි. ප්‍රජාතන්ත්‍රවාදය වැඩි දෙනෙකු පිළිගන්නා දියුණු පාලන ක්‍රමයකි. නමුත් එයට වඩා උතුම් අංග සහිතව රාජ්‍ය පාලනයට උපයෝගීකරගත හැකි පුලුල් දර්ශනයක් බුදු දහමෙහි දැක්වෙයි. එය සාමකාමී, සංවර මැද මාවතකි. සාකච්ඡාවෙන්, අවබෝධයෙන් ගැටලු නිරාකරණය කරගන්නා අන්දම දක්වන මගකි. මහජනතාවටත්, පාලකයන්ටත් සරල මගපෙන්වීමකින් සමන්විතය. අද ප්‍රජාතන්ත්‍රවාදය සංකීර්ණ ගැටලු ඇතිකර තිබේ. එහි ඇත්තේ අතෘප්තියයි. බල තන්හාවයි. එකිනෙකා පරයා නැගී සිටීමේ තරඟයයි. පක්ෂ හා පුද්ගලයන් ප්‍රචණ්ඩත්වයට පොළඹවන සංස්කෘතියකි. දේශපාලන වෛරය ඇති කරන පාලනයකට වඩා රටට අනන්‍ය, අදට ගැලපෙන නව දර්ශනයක් අපට සකස් කර ගත නොහැක්කේ මන්ද? බුද්ධ දර්ශනයෙන් එයට මග සකසා ගත නොහැකිද?

පසුගියදා බ්‍රිතාන්‍ය සංචාරයක නිතරව එරට පාර්ලිමේන්තුව ඇමතූ ඇමරිකානු ජනාධිපති බැරක් ඔබාමා මහතා ප්‍රජාතන්ත්‍රවාදය මුහුණ දී ඇති අභියෝග පෙන්වා දුන්නේය. නායකයන්ගේ භූමිකාව හා ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණු වෙනස් වී ඇති අන්දම විග්‍රහ කළේය. නායකයින්ගේ හඬ ඉහළ සිට පහලට ගමන් කරනු නොව පහළ මට්ටමේ මහජනතාවගේ අදහස් වලටත් නායකයින් සවන් දිය යුතු බව හෙළි කළේය. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය කුමක්ද? රටවල් පැවතිය හැකිය. ඒ රටවල් තුළ විවිධ ජාතීන්, විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන් ජීවත්වෙයි. එය රටක් නොව මවුබිමක් බවට පත්වන්නේ සියලු දෙනා එකට එකතු වී එක අරමුණකින් ක්‍රියාකරන අවස්ථාවේ දී බව ඔබාමා මහතාගේ දේශනයෙන් පළවූ වැදගත් අදහසකි. මේ අදහස් පළ කරන්නට ලෝකයේ දියුණු ම හා බලවත්ම ප්‍රජාතන්ත්‍රවාදියාට සිදුවූයේ ඇයි? එය ඓතිහාසිකව විග්‍රහ කළ යුතු වැදගත් කරුණකි.

බුද්ධ දේශනාව අනුව සමානාත්මතාවය ඉහළින් සැලකෙයි. කෙනෙකු උසස් හෝ පහත් වන්නේ ක්‍රියාවෙන් මිස උපතින් නොවේ. The Argumentative Indian නමින් කෘතියක් සම්පාදනය කළ නොබෙල් සම්මාන දිනූ ආර්ථික විද්‍යාඥ Amartya Sen අමර්තයා සෙන් මහතා මහා ප්‍රජාතන්ත්‍රවාදියෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේ ගේ දර්ශනය පුලුල් විශ්ලේෂණයකට ලක් කර තිබේ. බුදුන් වහන්සේ අනුගමනය කළ ප්‍රතිපත්ති අනුව ප්‍රජාව සාමූහිකව රැස්වී, විවෘතව සාකච්ඡා කළ අන්දම විග්‍රහකර තිබේ. මහා සංගායනා පවත්වන ලද ආකෘතිය අවධානයට ලක් කර තිබේ. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ හරය, එහි ගුණාංග සහ විශ්ව සාධාරණත්වය යළි විශේෂ අවධානයට ලක් වෙමින් ඇත. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය අර්බුදයකට පත්ව ඇතැයි කියන විට මේ සංගායනාව අපේ නායකයන්ට අදහස් හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් නොවේද? ගැටුම් මත අරගල වෙනුවට සුහදව රැස්වී සන්සුන්ව කතාකර සම්මුතියකට එළැඹිය නොහැකිද? ශ්‍රී ලංකාවේ ප්‍රශ්න විසඳා ගන්නට ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය බවට කියයි. අපට ඇති බෞද්ධ උරුමය අනුව නව ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට හැකියාව ඇත. එය අප යටත් විජිතයක් බවට පත්වීමෙන් යටපත්වූ ලාංකික අනන්‍යතාවය යළි සොයා යාමකි.

යටත් විජිත යුගයේ දී අණ පණත්, විධි විධාන සකස් වූයේ බටහිරට පාලනයේ උමනාව අනුවය. සොබා දහමට සමීප රාජ්‍ය පාලනය අහෝසි විය. ලංකාවට ඩොනමෝර් පාලන ක්‍රමය හඳුන්වා දුන්නේ බ්‍රිතාන්‍යයයි. එය ප්‍රජාතන්ත්‍රවාදයට පෙරහුරුවක් වශයෙනි. සර්වජන චන්ද බලය 1931 වසරේ දී හිමිවිය. ඡන්ද ක්‍රමය සහි ආසියාවේ රටවල් අතර ලංකාවට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. නිදහස ලබන විට මහජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තු ක්‍රමයක් ස්ථාපිත විය. ලංකාවේ පළමු ව්‍යවස්ථාව සම්පාදනය කරන ලද්දේ ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් Sir Ivor Jennings මහතාය. එතුමා මෙරට නායකයින් සමග සාකච්ඡා කර රටට ගැලපෙන ව්‍යවස්ථාවක් සම්පාදනය කළේය. ඉන්දියාව මේ අන්දමට ම සකස් කර ගත් ව්‍යවස්ථාව පසුව තම සංස්කෘතියට ගැලපෙන අන්දමට වෙනස් කර ගත්තේය. අප එකී බටහිර හඳුන්වා දුන් ව්‍යවස්ථාව තවමත් අනුගමනය කරයි. ව්‍යවස්ථාව වෙනස් කළේ පක්ෂ දේශපාලනයේ පටු අවස්ථාවාදී අන්දමටය. අද පවතින ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, ඇමරිකානු නිදහස් ආකල්ප පමණක් නොව ප්‍රංශයේ විධායක ජනාධිපති ක්‍රමයත් ඇතුලත්ය. විවිධ සංශෝධන නිසා රටට අද ඉතිරිවී ඇත්තේ සමාජය එහි නිර්මාණය කරන්නට දායක වූ ජාතික නායකයන් ගැන පවා නොදන්නා ව්‍යවස්ථාවකි. එපමණක් නොවේ. එය යළිත් සංශෝධනය කරන බව සඳහන් කළත් මහජනතාව ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදක්වයි.

ලොව මහා ප්‍රජාතන්ත්‍රවාදී නායකයා බුදු රජාණන් වහන්සේ බව හා එම දර්ශනය ලෝකය පුරා පැතිර යන අවස්ථාවක ශ්‍රී ලංකාවට එකී අවස්ථාව සුවිශේෂී විය යුතුය. බුදු දහම පවතින, එය ආරක්ෂා කරන රාජ්‍යයකට බුද්ධ දර්ශනයේ ප්‍රතිපත්ති ව්‍යවස්ථාවට ඇතුල් කර ගත හැකිය.

ප්‍රජාතන්ත්‍රවාදි පාලනය බිහිවූයේ ලෝකය එය ඉල්ලා සිටි අවස්ථාවේ දීය. ඉතිහාසයේ විවිධ සංස්කෘති හා සමාජවලට අයත් ජන කණ්ඩායම් මුහුණදුන් අභියෝගවල ප්‍රතිඵල අනුව සකස් වූවකි. බ්‍රිතාන්‍ය තුළ ප්‍රජාතන්ත්‍රවාද මූලික ලක්ෂණ බිහිවූයේ John රජු හා English Barons වරු අතර පැවති අරගලය සමගය. එය සමථයකට පත්වූයේ රජු හා රදළයන් අතර ගිවිසුමක් අත්සන් කිරීමෙනි. එය මැග්නාකාර්ටා Magna Carta ගිවිසුමයි. ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ මුල් අදහස නිශ්චිතව දැක්වෙන පළමු ඓතිහාසික ලියැවිල්ල ලෙස මෙය ඉතිහාසයට එක්ව තිබේ. ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය බිහිවූයේ එරට අලුත් සමාජයක් බිහිවන අවස්ථාවේදීය. නිවහල් අවස්ථා සොයා විවිධ රටවලින් ඇමරිකාවට ගිය කණ්ඩායම් තම අයිතිවාසිකම් පදනම් කරගත් අනන්‍ය පිළිවෙතක් සකස් කර ගැනීමට උනන්දුවූහ. මිනිස් නිදහසට හා අයිතිවාසිකම් වලට මුල්තැන දෙමින් එරට ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප සකස් වූ

අතර Bill of Rights යනුවෙන් ඔවුන් සකස් කරගත් කරුණු දහයකින් සමන්විත රාමුව එරට ව්‍යවස්ථාවට මූලික රාමුවක් විය.

දැනට අප රට තුළ ක්‍රියාත්මක බටහිර ආදර්ශයට ගත් ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණය බලය එක තැනෙකට එකතුවීම වැලැක්වීමයි. පුද්ගලයන්ට හෝ ආයතන වලට ඒකාධිකාරී තනි තීරණ ගන්නට ඉඩ ඇවිරීමයි. එකිනෙක මත විරුද්ධව ක්‍රියා කිරීමෙන් බලය සීමා කරන ව්‍යුහයක් බටහිර ප්‍රජාතන්ත්‍රවාදයට ඇතුලත්ය. ව්‍යවස්ථාදායකය හා අධිකරණය වැනි ආයතන එකිනෙක මත යුක්ති සහගත අන්දමින් පාලනයවීම නිසා මහජනතාවට සාධාරණය ඉටුවෙයි. බලය බෙදාහැරීමෙන් ඍජු ප්‍රජාතන්ත්‍රවාදය දක්වා පාලනය විහිදෙන්නේ මෙම සංකල්පයයි. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය හා විපක්ෂයක් ඇත. මේ ආයතන හා ඒවායේ ක්‍රියාකාරකම් මැද විරුද්ධවීම්, මතගැටීම් සිදුවෙයි. මෙවැනි සංකල්ප බටහිර ප්‍රජාවට දරාගත හැකි වූ නමුත් ලංකාවේ සංස්කෘතිය අනුව වෙනත් අනපේක්ෂිත පැති වලට යොමුවිය. බලය ලබා ගැනීම අභිප්‍රාය බවට පත්විය. පක්ෂ බෙදීම් ගමන් කළේ අන්තවාදය වෙතය. බටහිර ප්‍රජාතන්ත්‍රවාදයේ දී සිදුවූයේ විරුද්ධ මත ඇති පක්ෂ පවතින අතර රට වෙනුවෙන් පොදු තීරණ ගතයුතු අවස්ථාවේ දී එකතු වී වැඩ කිරීමයි. පක්ෂ අතර අදහස් ගැටීම තුළින් යහපත් දේ මතුකර ගත්තේය. අප ට ලැබුණ ව්‍යවස්ථාව මගින් මත ගැටීම්, පක්ෂ විපක්ෂ කණ්ඩායම් අතර අදහස් ගැටීමෙන් අපේක්ෂා කළ යහපත් තත්ත්වය උදා කරගත නොහැකි වූ බව අද පැහැදිළිව පෙනෙන කරුණයි.

බ්‍රිතාන්‍ය, ඇමරිකා, ප්‍රංශ හෝ ඉන්දියානු ව්‍යවස්ථාව නිර්මාණයවූයේ දීර්ඝ වශයෙන් අධ්‍යයනයකර විවිධ පැතිවලින් කරුණු සලකා බැලීමෙන් පසුවය. එකී රටවල සංස්කෘතිය හා අනන්‍යතාවයට ගැලපෙන අන්දමටය. ව්‍යවස්ථාවේ අඩංගු කරුණු ඒ රටවල මහජනතාවට අවබෝධයක් ඇත. යුතුකම් හා වගකීම් ගැන දනී. අඩු තරමින් පාසල් වියේ පටන් ම දූ දරුවන් තම රටේ ව්‍යවස්ථාවේ අඩංගු කරුණු ගැන අධ්‍යයනය කරති. අප රටේ ව්‍යවස්ථාව ගැන පාසල් දරුවන් තුළ පවා වැඩි උනන්දුවක් නැත. ව්‍යවස්ථාව මගින් රටවැසියන් ශ්‍රී ලාංකිකයන් ලෙස එකමුතු කරන්නට සමත්ව නැත. ජාති හා ආගම් වශයෙන් බෙදුන සමාජය පක්ෂ වශයෙන් ද සාහසික ලෙස බෙදන්නට මේ ක්‍රමය සමත් වූ බව පෙනේ. මහජනතාවගේ අයිතිවාසිකම් හා නිදහස සහමුලින්ම නොතකා නොසලකා හැර ඇත. මේ නිසා සිංහල, දෙමළ හා මුස්ලිම් අන්තවාදය බිහිවිය. ආගමික දැඩි මතධාරීන් බිහිවී තිබේ. බ්‍රිතාන්‍ය මානසික වහල් බව අනුව යමින් ලාංකික සමාජය, ඉංග්‍රීසි කතාකරන හා නොකරන වශයෙන් පටු අන්දමට වෙන්වී ඇත. පුද්ගලයාගේ දක්ෂතාවය හෝ හැකියාවට සාධාරණ අවස්ථා හිමි නොවන බව පැහැදිලි මෙවැනි ස්වභාවයකින් ප්‍රජාතන්ත්‍රවාදයේ උතුම් ගුණාංග ආරක්ෂා වී ඇතැයි අපේක්ෂා කළ හැකිද?

මහජනතාවගේ නොසැලකිල්ලට නොව ඔවුන්ගේ අවධානයට ලක්වන රටේ ප්‍රධාන ලියැවිල්ල බවට ව්‍යවස්ථාව පත්කළ හැක්කේ එය මහජනතාව වෙනුවෙන් බව පෙන්නවන්නට පාලකයන් සමත්වුවහොත් පමණකි. පවතින ක්‍රමය අනුව පක්ෂ වලට බෙදී දොස් පරොස් දකින්නේත්, ගහ මරා ගන්නේත් මහජනතාව වෙනුවෙන්ද? යුරෝපීය රටවල මැතිවරණය අවස්ථාවේ පිල්බෙදී විවේචනය කරන නමුත් ඡන්දය අවසන් වූ පසු පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ විපක්ෂ සියලු දෙනා එකතු වී ආණ්ඩු කරන ව්‍යවස්ථාවක් ඇත.

රටක් වශයෙන් මේ සියලු තත්ත්ව සමාලෝචනය කරන්නට අද අලුත් අවකාශයක් ඇත. සමාජ අතෘප්තිය, අසාධාරණය හා අයුක්තිය තුරන් විය යුතුය. සියලු දෙනා එකතු වී ප්‍රශ්න කතා කරන සම්මුතියෙන් තීරණ ගන්නා ක්‍රමයක් අපට අවශයය. ලොව මහා ප්‍රජාතන්ත්‍රවාදී නායකයා වශයෙන් බුදු රජාණන් වහන්සේ ගේ දැක්ම සමානාත්මතාවය හා මධ්‍යම ප්‍රතිපදාව සම්බන්ධ පුලුල් දර්ශනයක් ඉදිරිපත් කරයි. ඒ අනුව හැඩගැසුන සංස්කෘතියක් අපට ඇත. බුදු හිමියන් පෙන්වූ මාවත අනුව යමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට අලුත් මාවතක් විවර කර ගන්නට රටට අවකාශ ඇත. අමර්තයා සෙන් පෙන්වන්නේ ප්‍රශ්නයක් ඇති වූ විට දෙපැත්තට බෙදී තර්ක ප්‍රතිපත්තිය වෙනුවට එකට එකතු වී සාකච්ඡා කරන පෙරදිග තිබුණ බවය. බුදු

දහම සම්බන්ධයෙන් අර්බුද ඇතිවූ විට ධර්ම සංගායනාවක් කළේය. බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වීම සමග මාර්ග ඵල අවබෝධකරගෙන නොසිටි සංඝරත්නය අතර ඇතිවූ ශාසනික ගැටලු පළමු ධර්ම සංගායනාවට හේතු විය. විනය පිටකයට අයත් චුල්ල වග්ගය එය සඳහන් කරන්නේ සුභද්‍ර නම් හිමි නමක්, කරන ලද ගැටලු සහගත ප්‍රකාශයකට පසු ශාසනයේ පැවැත්ම අභියෝගයකට ලක්වන ලකුණු දැක මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පළමු සංගායනාව පවත්වන ලද බවය. දෙවනුව බුදු රජාණන්වහන්සේගේ පිරිනිවන් පෑමෙන් වසර සියයකට පසුව ද, තෙවැන්න මොග්ගලී පුත්තතිස්ස මහ රහතන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පාටලී පුත්ත නගරයේ දී ද පැවති බව මහාවංශයෙහි සඳහන්ය. පාටලී පුත්ත නගරයේ සංගායනාව පවත්වන්නට අශෝක අධිරාජ්‍යයා සම්බන්ධ විය. රජෙකු වශයෙන් අභිමතයට පරිදි සංගායනාව පවත්වන්නට ඉඩ තිබුණි. එනමුත් ඔහු එවකට පැවති සම්ප්‍රදායයට ඉඩ දුන්නේය. සියලු දෙනා එක් රැස්වී සාකච්ඡා කර සම්මුතියකට පැමිණීම එයයි.  පාටලී පුත්ත නගරයේ පැවති තුන්වැනි සංගායනාවේ දී සහභාගී වූ මහා සංඝරත්නය ට එකිනෙකා පහත් නොකරන එකිනෙක නිකාය අවමානයට පාත්‍ර නොකරන අදහස් පළ කිරීමේ රාමුවක් තිබී ඇත. එය අද සම්මන්ත්‍රණයක ඇති න්‍යාය පත්‍ර සකස් කරන සම්මතය හඳුන්වාදෙන්නට සැහෙන කාලයකට පෙර පවා භාවිත ක්‍රමයකි. එම සංගායනාවේ දී තවත් කෙනෙකුගේ මතයකට අවමන් කර නැත. අනෙක් පාර්ශවයේ මතයට ගරු කරන පිළිවෙතක් එහි තිබී ඇත. මේවා උතුම් සංකල්පයන්ය. ශ්‍රී ලංකාවේ පක්ෂ වලට බෙදී වාද කර පසුව වැඩිදෙනාගේ කැමැත්තට ඉඩ දෙන ප්‍රජාතන්ත්‍රවාදයට වඩා සියලු දෙනාගේ ම සම්මුතිය පාලනයේ දී වැදගත්ය. එවැනි සම්මුතිය ඇති කරන පාලන ක්‍රමයකට ධර්ම සංගායනාවෙන් ගත හැකි ආදර්ශය වැදගත් එකකි.

නියම ප්‍රජාතන්ත්‍රවාදය මහජනතාව පාලකයන් හා සියලු පාර්ශව එකතුවී ඉදිරි ගමන ගැන සාකච්ඡා කිරීමයි. එය අද අප හමුවේ තිබේද? අවංකව ප්‍රශ්න කරමු. රටට අනන්‍ය ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන විවෘත කතාබහක් ඇති වීම උවමනාවකි. ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක්ව ඇති බලය හා බලහත්කාරය පැතිරෙන මේ අවස්ථාවේ දී පොසොන් උදාව සමග රටට අලුත් ආකල්පයකින් පවතින ප්‍රශ්න දෙස අවධානය යොමු කළ හැකිය. අප සියලු දෙනාටම එකතු වී සම්මුතිය ඇති කරගන්නා ව්‍යවස්ථා රාමුවක් ගැන ධර්ම සංගායනාවෙන් දැක්මක් ඇති කරගත හැකිය.

මෙවැනිම පසුබිමක ඇමරිකාවේ හිටපු  ජනාධිපතිවරයෙකු වූ ජෝන් ඇඩම්ස් මහතා කළ සුවිශේෂී සඳහනක් මෙහිදී සිහිපත් කිරීම වටී.

"We please ourselves with the prospect of free and popular governments but there is great danger that those governments will not make us happy. But I fear that in every assembly members will obtain an influence by noise not sense, by meanness not greatness, by ignorance not learning, by contracted hearts not large souls. There is one way, my dear sir, that must be attempted and most sacredly observed or we are all undone. There must be decency and respect and veneration introduced for persons of authority of every rank or we are all undone."

එහි සරල පරිවර්තනයක් දැක්වුවහොත් මෙසේය.

'' ආණ්ඩුවක් හැටියට ජනප්‍රිය හා ශක්තිමත් ලෙස අප ගැනම සිතන  නමුත් විශාල අවදානමක් ඇත.  සෑම සභිකයෙකුම සිය බලය ලබා ගන්නේ නිහඬ බුද්ධිමත් බවින් නොව ඝෝෂාවෙනි. පහත් දේ මගින් මිස විශිෂ්ට දෙයින් නොවේ. නොදැනුවත් බවින් මිස දැනුවත් බවින් නොවේ. එවැනි අවස්ථාවක හැකිලෙන හදවත් විශාල ආධ්‍යාත්මයක් ද ඇති නොකරයි. අප උත්සාහ කළ යුතු එහෙත් මෙතෙක් නොකරන ලද එක් දෙයක් ඇත. ආධිපත්‍ය දරන අප සියලු දෙනාටම ගරුත්වය හා පූජනීයත්වය සම්බන්ධයෙන් අවබෝධයක් තිබිය යුතුය. එසේ නොවුන හොත්  අප සියලු දෙනාම පිරිහේ.''